උසස් පෙළ කෘෂිකර්මය

# එළදෙන රැක බලා ගැනීම

අ.පො.ස. උසස් පෙළ කෘෂි විද්‍යාව විෂය හදාරණ පාඨක ඔබේ ඉල්ලීම වෙනුවෙන් එම විෂය නිර්දේශය අලලා සැකසුනු ලිපි පෙළක පළමුවැන්නයි මේ. ඒ වෙනුවෙන් වෙන්වූ සීමිත ඉඩ ප්‍රමාණයෙන් උපරිම ප්‍රයෝජන ලබාදීම පිණිස ඡේදමය ස්වරූපයෙන් කරුණු ඉදිරිපත් කිරීමට අපි බලාපොරොත්තු වෙමු. මෙම ලිපිය මගින් 'ගව පාලනය' ඒකකය යටතේ එන ප්‍රසූතියට ආසන්න එළදෙන රැකබලා ගැනීමේ සිට පැටවී පාලනය දක්වා කරුණු සාකච්ඡා කෙරේ.

**ප්‍රසූතියට ආසන්න එළදෙන රැක බලා ගැනීම :**

සාමාන්‍යයෙන් එළදෙනකගේ ගැබ් කාලය දින 280 කි. මින් ප්‍රසූතියට ආසන්න දින 60 ක පමණ කාලය ගව දෙනගේ කායික තත්ත්වයේ විශේෂ අවස්ථාවක් වේ. මෙම කාල සීමාවේදී කලලයේ බර 50% කින් පමණ වැඩි වන අතර, ශරීරය හා කිරි බුරුල්ලේ ක්‍රියාකාරීත්වය, ලබන කිරි මුරය සඳහා මනාව පදම් කර ගත යුතු වේ. මෙම කායික අවශ්‍යතා සපුරා ලීම සඳහා දෙන පහත අයුරින් රැක බලා ගත යුතුයි.

> **සාමාන්‍යයෙන් එළදෙනකගේ ගැබ් කාලය දින 280 කි මින් ප්‍රසූතියට ආසන්න දින 60 ක පමණ කාලය ගව දෙනගේ කායික තත්ත්වයේ විශේෂ අවස්ථාවක් වේ.**

**පෝෂණ මට්ටම වැඩි කිරීම**

මේ කාලයේදී ගවදෙනගේ ආගනුව ස්වාභාවිකව වැඩි වේ. සම්පූර්ණ දිරවිය හැකි ආහාර ප්‍රමාණය (ටී.ඩී.එන්.) 66% ක් හා දළ ප්‍රෝටීන (සී.පී.) 12% ක් සහිත සංඝටකයන්ගෙන් යුත් ආහාර සලාකයක් මේ අවධියේ ලැබිය යුතුය. එනමුත් අවසාන සති 2 තුල ආගනුව ක්‍රමානුකූලව අඩු වේ. එම කාලයේදී කෙඳි ගතිය අඩු පෝෂණ ද්‍රව්‍ය බෙහෙවින් අවශ්‍ය වේ. මෙසේ අත්‍යාවශ්‍ය සංඝටක වලින් තොර ආහාර සලාකයක් නොලද හොත් කලලයේ වැඩීම මෙන්ම එළ ගවයාගේ ශරීර වර්ධනය හීන වේ. එමගින් ලබන කිරි මුරයේ නිෂ්පාදනයද පහල බසී. මීට අමතරව අවශ්‍ය පමණ බීමට ජලය හා ලවණ මිශ්‍රණයක් සැපයීමත් ඉතා වැදගත්ය. නවීන මතය අනුව අවසාන දින 14 දී ආහාර සලාකයේ කැල්සියම් අඩු කිරීමෙන් හා ප්‍රසූතියෙන් පසු කැල්සියම් වැඩිකිරීමෙන් උසස් නිෂ්පාදනයක් ඇති කිරි ගවයන්ට වැලදෙන කිරි උණ රෝගය වලක්වා ගත හැක. (අඩු කිරි නිෂ්පාදනයක් ඇති දෙනුන්ට මෙය අදාල නැත.)

තවද පෝෂණ මට්ටම ප්‍රමාණවත්දැයි මැන ගත හැකි ක්‍රමයක් ඇත. එනම් ශරීරයේ බාහිර ලක්ෂණ අනුව තෝරා ඇති ඇටවල පෙනුම අනුව, 1-5 දක්වා ලකුණු ක්‍රමයකින් අදාල පෝෂණ මට්ටම සොයා ගත හැකි වේ. මේ සඳහා ඉල ඇට, කොඳු ඇට, ලම්භා ඇට හා වලිගය මුල, සමේ රවුම් ගතිය නොහොත් මාංශ පේශීන්ගේ වැඩීම උපයෝගී කර ගත හැක.

ලකුණු 1-1.8 - කෙට්ටු භාවය හෝ මන්ද පෝෂණය

4-5 - මහත බව නැතහොත් අධි පෝෂණය.

මෙසේ මැනගත් විට ගැබ් කාලයේ අවසානයේදී ශරීරයේ තත්ත්වය ලකුණු 3 සිට 3.5 දක්වා වේ නම්, එළ ගවයාට ලැබී ඇති ආහාර සලාකය ක්‍රමවත් බව පැහැදිලි වේ.

> **ප්‍රසූතියෙන් පසු කැල්සියම් වැඩිකිරීමෙන් උසස් නිෂ්පාදනයක් ඇති කිරි ගවයන්ට වැලදෙන කිරි උණ රෝගය වලක්වා ගත හැක.**

කි.ග්‍රෑම් 300 බර ගවයෙකු සඳහා යෝජිත ආහාර සලාකයන් :

| | | |
|---|---|---|
| 1. උසස් වර්ගයේ තෘණ | කි.ග්‍රෑ. | 45-60 |
| 2. රනිල කොළ වර්ග | කි.ග්‍රෑ. | 5-10 |
| 3. සාන්ද්‍ර ආහාර | | |
| පොල් පුන්නක්කු | කි.ග්‍රෑ. | 1 |
| සහල් නිවුඩු | කි.ග්‍රෑ. | 1 |
| මොලැසස් (කර උක්) (ක්ෂුපාක) | ග්‍රෑම් | 200 |
| ලවණ මිශ්‍රණය | ග්‍රෑම් | 60 |

තල පුන්නක්කු, හාල් කැඳ, ධාන්‍ය පොතු ආදියද යොදා ගැනීමෙන් වැඩි කිරි ප්‍රමාණයක් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය රැක ගැනීම**

ප්‍රසූතියට ආසන්න එළදෙනට කිසිදු අපහසුතාවයකින් තොරව සැහැල්ලුවෙන් සිටීමට අවශ්‍ය කටයුතු සැලසීම වැදගත් වේ. තෘණ උලා කෑම සඳහා කඳු, කම්බි වැටවල්, කානු ආදිය සහිත ප්‍රදේශ වලට නොයැවීමෙන් හා තෘණ කපා ආහාරයට දීමෙන් දෙන වැටීමෙන් හෝ සීරීමෙන් අපහසුතාවයකට පත්වීම වලක්වා ගත හැක.

ගව රක්තපාතය, රින්ඩපෙස්ට්, කුර හා මුඛ රෝගය වැනි බෝවන රෝග හා පනු රෝග වලින් ආරක්ෂා කර ගැනීමට ඇයට ප්‍රතිශක්තිකරණය හා බෙහෙත් වර්ග ප්‍රථමයෙන් ලබා දී තිබිය යුතුය. දේශගුණික වෙනස්වීම් නිසා ඇතිවන කිනිතුල්ලන් බෝවීම, නිව්මෝනියාව වැනි තත්ත්ව වැළැක්වීමටත්, පිරිසිදුකම පවත්වා ගැනීමටත් ආවරණ සහිත ගාලක බැඳිය යුතුය. නැවීම හා ශරීරය පිරිමැදීම වැනි සාමාන්‍ය එදිනෙදා කටයුතු ද ක්‍රමානුකූලව සිදු කිරීම අවශ්‍ය වේ. ප්‍රසූතිය ආසන්න වූ විට විවේකීව සිටීමට හැරීම අත්‍යාවශ්‍ය වන අතර, මේ සඳහා අලුත් පිදුරු වලින් යුත් ප්‍රසූත කොටුවක් හෝ වියලි තෘණ බිමක් ඉතාමත් යෝග්‍ය වේ.

**ප්‍රසූතියට ආසන්න දෙන :**

ප්‍රසූතියට ආසන්න වන විට දෙනගේ වලිග මුල හා ශ්‍රෝණි පෙදෙසේ අස්ථි බන්ධන මෘදු වී ලිහිල් තත්ත්වයක පවතී.

සතියකට දෙකකට පමණ පෙර සිට විශාල වීම ආරම්භ වූ බුරුල්ල එහි උපරිමය තෙක් විශාල වේ. යෝනිය ඉදිමී ඉන් ශ්ලේෂ්මල ස්‍රාවය වේ. ශරීර උෂ්ණත්වය ද මදක් පහල බසී. දෙන මහත් අපහසුතාවයකින් පෙලෙන බවක් දක්නට ලැබේ.

ප්‍රසූතිය :

ප්‍රසූතිය ඇරඹෙන්නේ ගර්භාෂය සංකෝචනය වීමත් සමගයි. එහි ප්‍රතිඵලයක් ලෙස කලලය ග්‍රීවය තුලින් පිටතට ඒ. පළමුව කලල පටලද (වතුර කෝෂය) ඉන් අනතුරුව

**ප්‍රසූතියෙන් පසු මුල් දින 3-4 තුල දෙනගෙන් ස්‍රාවය වන කිරි මුල් කිරි හෙවත් කොලෙස්ට්‍රම් ලෙස හඳුන්වයි.**

ඉදිරි ගාත්වල කුර හා පැටවාගේ නාසය ද දර්ශනය වේ. මේ අවස්ථාවේදී පාලකයා දෙනට උපකාර වීමට බලාපොරොත්තු වන්නේ නම් පලමුව තම දෑත් හා දෙනගේ යෝනිය පෙදෙස පිරිසිදු කල යුතුය. ඉන්පසුව විෂබීජ නාශනය කරන ලද ලණු පටකින් හෝ දෑකින් ඉදිරි ගාත් පිටතට ඇදීම ප්‍රසූතිය සඳහා දරණ සංකෝචනවලට අනුකූලව ඉතා ප්‍රවේශමෙන් කල යුතුය. මෙම ප්‍රසූති ක්‍රියාවලිය සම්පූර්ණවීම සඳහා පැයක් පමණ ගත වන අතර පැටවා අසාමාන්‍ය ලෙස පිහිටි විටදී හා වෙනත් අස්වාභාවික තත්ත්ව වලදී ප්‍රමාද වීමට ඉඩ ඇත. එක් ගාතයක් පමණක් හෝ පසු ගාත් හෝ වලිගය පිටතට එනවිට හා හිස වෙනතකට යොමු වී ඉදිරි ගාත් පමණක් පිටතට එනවිට මෙසේ ප්‍රසූතිය අපහසු විය හැකිය. එබඳු අවස්ථාවලදී පැය 12 ක කාලසීමාවක් ගත වී ඇතිනම් හැකි ඉක්මණින් පශු වෛද්‍ය සේවය ලබා ගත යුතුය.

පැටවාට සාත්තු කිරීම

මව විසින් අලුත උපන් පැටවා ලෙව කෑමෙන් පිරිසිදු කරයි. එසේ නොමැති විටදී පාලකයා විසින් පැටවා පිරිසිදු කල යුතුය. ප්‍රසූතියේදී පැටවා හා මව අතර පෙකනිවැල සබඳතාවය බිඳී යාමෙන් මව සමග වූ ශ්වසන හුවමාරුව නැති වී යයි. මේ නිසා බාහිර වායුගෝලීය වාතය හොඳින් ලබා ගැනීමට හැකි වන පරිදි නාස්පුඩු හා මුඛය පිරිසිදු කල යුතුය. මේ වන විටත් පැටවා ශ්වසනය ආරම්භ කර නැතිනම් නාසයට පිඹීමෙන් හෝ කෙන්දකින් ස්පර්ශ කිරීමෙන් ශ්වසනය උත්තේජනය කල හැක. ද්වීතික අසාදන ඇතිවීම වැලැක්වීම සඳහා පෙකනි වැල බිඳී ගිය ස්ථානය මත කොහොඹ තෙල් හෝ අයඩීන් ආලේප කිරීම සුදුසුය. මීට අමතරව පැටවා පාරිසරික අපහසුතාවලට ලක් වීමට ඉඩ නොදිය යුතු අතරම දෙන පිළිබඳව ද සැලකිලිමත් විය යුතුයි. ප්‍රසූතියෙන් පසු ගර්භාෂය සංකෝචනය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ ආශ්‍රිත කලල පටල (වැදෑමහ) පිටවේ. මේ සඳහා දින කීපයක් වුවද ගත වේ. නමුත් ගර්භාෂය විවිධ අසාදන වලට ලක් විය හැකි බැවින් මෙසේ පිටවන ස්‍රාවයන් අධික දුගඳකින් යුක්තදැයි සුපරීක්ෂාකාරී විය යුතුය. එසේම පශු වෛද්‍ය උපදෙස් ද ලබා ගත යුතුය. පැටවාගේ සෞඛ්‍ය තත්ත්වය මෙන්ම පෝෂණ තත්ත්වය කෙරෙහි සැලකිලිමත් වන ගව පාලකයා හැකි ඉක්මණින් පැටවාට 'මුල්කිරි' උරාබීමට සැලැස්වීමට ද වග බලා ගත යුතුය.

මුල්කිරි

ප්‍රසූතියෙන් පසු මුල් දින 3-4 තුල දෙනගෙන් ස්‍රාවය වන කිරි මුල් කිරි හෙවත් කොලෙස්ට්‍රම් ලෙස හඳුන්වයි. ලා කහ පැහැති තරමක් උකු දියරයක් වන මෙහි සංයුතිය සාමාන්‍ය කිරිවලට වඩා වෙනස්ය ප්‍රෝටීන්, ගැමා ග්ලො බියුලින්, ඛනිජ හා මේද වැඩි ප්‍රමාණ වලින් ද අඩු ජල ප්‍රමාණයක් ද අඩංගු වේ. එබැවින් පෝෂණීය ගුණය අතින් ඉහලය. ඉපදීමෙන් පැය 6 ක් ගතවීමට පෙර මුල් කිරි උරාබීම සිදු විය යුතුයි. ඉපදී පැය 6-10 පමණ කාලයදී මෙම

**මුල් කිරි බීමෙන් අනතුරුව සාමාන්‍ය කිරි උරාබීමට හුරු වන පැටවාට දිගටම කිරි බීමට ඉඩ දීම ආර්ථිකමය නොවේ.**

ද්‍රව්‍ය ආන්ත්‍රික බිත්ති හරහා කෙලින්ම අවශෝෂණය වන අතර පැටවාට වැලැඳීමට ඉඩ ඇති බොහෝ රෝග වලට එරෙහි ප්‍රතිශක්තිය ලබා දේ. ඊට අමතරව මුල් කිරිවල ඇති සමහර ද්‍රව්‍ය විරේකයක් ලෙස ක්‍රියා කරමින් ආන්ත්‍රික මාර්ගය උත්තේජනය කරයි. මේ නිසා අළුත් පැටවාට හැකි ඉක්මණින් මුල් කිරි ලබා දීමට ගව පාලකයා උනන්දු විය යුතුය.

මුල් දින කීපය තුල දෙන සමඟ පැටවාට සිටීමට සැලැස්වීමෙන් මේ අවශ්‍යතාව ඉටු වුවත් මුල්කිරි ඉරීම පරීක්ෂාවට ලක් විය යුතුය. දෙනට අපහසු අවස්ථාවකදී හෝ නැවත කිරි උරා නො බොන විට දී මුල් කිරි දොවා බෝතලයකට දමා සූප්පුවක් ආධාරයෙන් හෝ ආමාශ නලයක් මාර්ගයෙන් පෙවිය යුතුය. මුල් කිරි දොවා පෙවීමට තරම් නුසුදුසු අවස්ථාවලදී (දෙනගේ බුරුල්ල අසාදන වලට ලක් වී ඇති විට) කෘතිම මුල්කිරි සකසා දිය යුතු අතරම කිරි දොවා බුරුල්ල සැහැල්ලු කල යුතුය. නමුත් වැඩි මුල්කිරි දොවා සැකසුම් ලෙස ඇසිරීමෙන් එය කල් තබා ගැනීමට හැක. එම මුල් කිරි කෘත්‍රිම මුල් කිරි වලට වඩා යෝග්‍ය වේ.

පැටවි පාලනය

මනා ලෙස පැටවුන් පාලනය නොකිරීමෙන් ගව පාලනයට විවිධ ගැටළුවලට මුහුණ පෑමට සිදු වේ. සතුන් රෝග වලට ග්‍රාවී වීමත්, වර්ධන වේගය අඩු වීමත්, සඵලතාවය අඩුවීම හෝ නැති වීමත් ප්‍රජනන අවධියට ඒමට වැඩි කලක් ගත වීමත් නිසා රංචුවෙන් ලබා ගත හැකි ආදායම අඩු වේ. මේ නිසා තම ගව රංචුවෙන් උපරිම වාසි අත්කර ගැනීමට ගව පාලකයා විසින් ගව පැටවි පාලනය පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

පැටවි අවධියේදී සිදු කල යුතු විශේෂ කාර්ය කීපයකි.

1. බර මැනීම

පැටවුන් ඉපදුන දින ඔවුන්ගේ බර මැනීම හා වැඩෙන කාලයේදී මාසයක් පාසා ඔවුන්ගේ බර මැනීම වැදගත් වේ. පපුවේ වට රවුම ලණුවක මාර්ගයෙන් අඟල් වලින් මැනීමෙන් හා එම අඟල් ගණන බර අනුව සකසා ගත් සටහනක් සමග සසඳා බැලීමෙන් තරාදි නොමැතිව සතාගේ බර සහ වැඩීම නිරීක්ෂණය කර ගත හැක.

2. හඳුනා ගැනීමේ ක්‍රම භාවිතය

පැටවුන් වෙන් කර හඳුනා ගැනීම සඳහා විවිධ ක්‍රම අනුගමනය කරනු ලබයි.

අ. කන් සලකුණු - අංකයක් හෝ අකුරක් හෝ වෙනත් සංකේතයක් සහිත ලෝහ හෝ ප්ලාස්ටික් කැබලි කන්පෙති වල එල්වනු ලැබේ.
සමහර අවස්ථාවලදී විශේෂ තීන්ත වර්ගයක් භාවිතයෙන් කන්වල ඇතුළු පැත්තේ සලකුනු කරනු ලබයි.

ආ. සතුන්ගේ ඡායාරූප තබා ගැනීම.

ඇ. කන් කැපීම - V හැඩැති සලකුනු යෙදීම.

ඈ. ගෙල පටිවල සලකුණු පැළඳවීම.

ඉ. හංවඩු ගැසීම - රත් කරන ලද යකඩ හෝ ද්‍රව නයිට්‍රජන් භාවිතා කර විශේෂිත අකුරු සලකුණු කරනු ලැබේ. නමුත් සමේ වටිනාකම අඩුවිය හැකි බැවින් පිටුපස පාදයේ දන හිසෙන් පහත කොටසේ හම මෙසේ නිවරණය කිරීම යෝග්‍ය වේ. හම නිවරණය සඳහා පැටවාගේ වයස මාස අටකට වැඩිවිය යුතුයි.

3. අං සිඳීම

අනාගතයේදී ඇති විය හැකි උවදුරු හා අපහසුතා මැඩලීම අං සිඳීමේ අරමුණ වේ. මේ සඳහා ද විවිධ ක්‍රම භාවිතා කරනු ලබයි.

අ. ගිනියම් යකඩයක් භාවිතා කිරීම.
පැටවා ඉපදී සති 2-3 කට පසුව මෙය සිදු කරයි. පලමුව අඟ ප්‍රදේශයේ ලෝම කපා අඟ මතුපිට ගිණියම් යකඩය තත්පර 10-15 ක් පමණ තබයි. මෙය වරින් වර සිදු කර අඟ වර්ධනය වීම නිශේධනය කරයි. මීට අමතරව රසායන ද්‍රව්‍ය භාවිතා කිරීම හා රබර් මුදු පැළඳවීම මගින් අං සිඳීම සිදු කරයි.

4. පෝෂණය

මුල් කිරි බීමෙන් අනතුරුව සාමාන්‍ය කිරි උරාබීමට හුරු වන පැටවාට දිගටම කිරි බීමට ඉඩ දීම ආර්ථිකමය නොවේ. එමෙන්ම අනාගතයේදී ප්‍රධාන ආහාරය වන දල ආහාර ගැනීම කෙරෙහි හැකි ඉක්මනින් පැටවා පුරුදු කිරීම ඉතා වැදගත්ය. මේ නිසා පැටවාට වයස දින 14 ක් පමණ වන විට සාන්ද්‍ර ආහාර දීම ආරම්භ කල හැක. ගවයා රෝමාන්තිකයෙක් වුවද මාස 4 ක් පමණ වන තුරු රුමනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වීම ආරම්භ නොවේ. ඒ සමග රුමනයේ වර්ධනය හා ක්‍රියාකාරිත්වය උත්තේජනය වීමටත්, රුමන් ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වීමටත්, තන්තුමය ආහාර ලබා දීම වැදගත්ය. මේ සඳහා ක්‍රමයෙන් පැටවා දල ආහාර වලට ද පුරුදු කල යුතුයි. අනතුරුව උලා කෑම සඳහා තෘණ පිට්වලට යැවීමට හැකි වේ. ක්‍රමයෙන් සාන්ද්‍ර ආහාර හා දල ආහාර වලට හුරුවන පැටවා ඉක්මනින්ම කිරි වැරීමට සුදුසු තත්ත්වයට පත් වේ.

5. කිරි වැරීම

ඉපදීමෙන් පසු දිනකට පැටවාගේ දේහ බරින් 10% ක කිරි ප්‍රමාණයක් අවශ්‍ය වේ. මේ අනුව කිරි ලැබෙන විට පැටවාගේ වර්ධනය ක්‍රමානුකූල වේ. මුල් කිරි ලැබීමෙන් පසු පැටවාට මවුකිරි වෙනුවට අඩු මිලට සාදා ගත් පිටිකිරි වර්ග දිය හැකිය. ඒ සමගම ඉපදී දින 14 සිට සාන්ද්‍ර ආහාර, තලන ලද බඩ ඉරිඟු නැතහොත් බතල වැනි අල වර්ග ද, වියලි තෘණ පුරුදු කිරීමෙන්, ඉපදී සති 4 දී කිරි වැරීම කල හැක. ඉපදුන දින සිට, දිනකට ග්‍රෑම් 400-600 ක හෝ 1000 ක බර වැඩිවීමක් ඇති වීම ඉක්මනින් කිරි වැරීමේ පරමාර්ථය වේ. (ගවයින්ගේ වර්ග අනුව) පැටවුන්ගේ කිරි ඉරීම හා මව් දෙනගේ දර්ශන පථයට හමුවීම සීමාකිරීමෙන් මව් දෙන ඉක්මනින් නැවත ගැබ් කර ගැනීමට හැකි වේ.

**මුල් කිරි ලැබීමෙන් පසු පැටවාට මවුකිරි වෙනුවට අඩු මිලට සාදා ගත් පිටිකිරි වර්ග දිය හැකිය.**

6. එන්නත් කිරීම හා පණු බෙහෙත් දීම

පහත සඳහන් ආකාරයට වසු පැටවුන්ට එන්නත් හා පනු බෙහෙත් ලබා දිය යුතුය.

පළමු සතිය තුල -

කම්බැන්ට්‍රින්, ඇල්බෙන්ඩසෝල් හෝ නිල්වර්මි වැනි පණු බෙහෙත් වර්ගයක් ජීව බර අනුව ලබා දීම.

දෙවන සතිය තුල -

සැල්මොනෙල්ලොසිස් සඳහා එන්නත් කිරීම.

තෙවන මාසය තුල -

නැවත ජීව බර අනුව පණු බෙහෙත් දීම.

තෙවන මාසයේ සිට හය හත මාසය දක්වා- පහත රෝග සඳහා එන්නත් ලබා දීම.

කුර හා මුව රෝගය
ගව රක්තපාතය
රින්ඩපෙස්ට්
ඇන්ත්‍රැක්ස්
කාල ගාත්‍ර රෝගය

7. නිවාස සැපයීම

වසු පැටවුන්ගේ කුඩුවලට හොඳින් හිරු එලිය හා වාතාශ්‍රය ලැබීම අත්‍යාවශ්‍යය. සාමාන්‍යයෙන් වර්ග අඩි 24 ක් පමණ කුඩු ඉතා යෝග්‍යයි. මේ කොටුවල ජල බඳුන් හා ආහාර බඳුන් තිබීම අවශ්‍ය වේ. පැටවුන් තනි තනිව මෙන්ම කණ්ඩායම් ලෙස ද පාලනය කල හැකි අතර, ඔවුන් ලෙව කා ගැනීමෙන් රෝගී තත්ත්වයට පත්විය හැකි නිසා මුල් සති කීපය තුළ තනි තනිව පාලනය කිරීම වැදගත් වේ.

පශු වෛද්‍ය ටී. එන්. ජයතිලක
සමග සාකච්ඡා කළේ
පී. ආර්. වීරක්කොඩි

මෙම සහරාව සැකසීමේදී පර්යේෂණ හා පුහුණු කිරීමේ නිළධාරී පී. පියරත්න මහතාගෙන් ලැබුණු සහයෝගය අගය කරමු.
- කර්තෘ